# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1923/14 - 2015 ජූලි මස 14 වැනි අඟහරුවාදා - 2015.07.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : සී.අයි/353.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ අංක 117 දරන ස්ථානයේ පිහිටා ඇති කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සී සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, 22 වෙනි පටුමග, නො. 03 දරන ස්ථානයේ පිහිටා ඇති ලංකා වෙළඳ, කාර්මික සහ පොදු කම්කරු සංගමය (සීඑම්යූ) අතර 2014 ඔක්තෝබර් මස 16 වන දින ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුම (ඉංග්‍රීසි භාෂාවෙන්, සිංහල සහ දමිල භාෂාවට පරිවර්ථනය කිරීමෙන්) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,<br>
කම්කරු කොමසාරිස්.

2015 මැයි මස 26 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

2014 අංක 37 දරන සාමූහික ගිවිසුම

සිංහල පරිවර්තනය

**සාමූහික ගිවිසුමයි**

කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත අංක 117 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නිසි පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සී (මින්මතු 'සේවායෝජක' යනුවෙන් හඳුන්වනු ලැබේ) සහ කොළඹ 3, 22 වැනි පටුමගේ, අංක 3 හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නිසි පරිදි ලියාපදිංචි වෘත්තීය සංගමයක් වන ලංකා වෙළෙඳ, කාර්මික සහ පොදු කම්කරු සංගමය (සීඑම්යූ) (මින්මතු වෘත්තීය සංගමය යනුවෙන් හඳුන්වනු ලබන), අතරේ වර්ෂ 2014 ක් වූ ඔක්තෝබර් මස දහසය වන දින ඇතුළත් වන ලද ගිවිසුමයි.

ඉදින්, වෘත්තීය සංගමය සහ සේවායෝජකයා, සේවා අනුදේශ සහ කොන්දේසි සංශෝධනය කිරීම පිළිබඳව පවත්වන ලද සාකච්ඡා මාලාවකට පසුව පහත දැක්වෙන ගිවිසුම සම්බන්ධයෙන් එකඟවී/ගිවිසගෙන ඇත.

1. මෙම ගිවිසුමේ අනුදේශ මගින්, සේවායෝජක, වෘත්තීය සංගමය සහ එම වෘත්තීය සංගමයේ ජාඇල, ඒකල, මිනුවන්ගොඩ පාරේ අංක 16 දරන ස්ථානයෙහි පිහිටි හි නිෂ්පාදන පරිශ්‍රයේ (මින්මතු කර්මාන්තශාලාව යනුවෙන් හඳුන්වනු ලැබේ) කායික ශක්නුතාවය යටතේ සේවයේ යොදවා සිටින වෘත්තීය සංගමයේ සාමාජිකයන් (මින්මතු 'සේවකයින්' යනුවෙන් හඳුන්වනු ලැබේ) ආවරණය සහ බන්ධනීය කරනු ඇති අතර, කෙසේ වුවද1-13 දක්වාවූ වගන්ති, කායික ශක්නුතාවය යටතේ ස්ථිර මාසික රැකියා කොන්ත්‍රාත්තු මත සේවයේ යොදවා සිටින වෘත්තීය සංගමයේ සාමාජිකයන් හට පමණක් (මින්මතු 'සේවකයින්' යනුවෙන් හඳුන්වනු ලැබේ) බලපානු ඇත.

2. මෙම ගිවිසුම 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන අතර, දෙපාර්ශ්වයෙන් ඕනෑම පාර්ශ්වයක් අනික් පාර්ශ්වයට එක් මසක ලිඛිත දැනුම්දීමක් කරමින් වෙනත් ආකාරයකින් අවසන් කරන තුරු බලපවත්වන අතර, කිසිම පාර්ශ්වයක් 2016.10.01 දිනට පෙර එවැනි දැනුම්දීමක් නොකළ යුතු වන අතර කෙසේවුවද, 2016.10.31 වන තුරු මෙහි අවසන් කිරීම ක්‍රියාත්මක නොවනු ඇත.

3. මෙම ගිවිසුමේ කාලය තුළදී පහත දැක්වෙන පරිදි මෙම ගිවිසුමෙන් ආවරණය වන සහ බන්ධනීය වන සේවකයින්ගේ වැටුප් ප්‍රතිශෝධනය කිරීමට සේවායෝජක එකඟ වෙයි.


1 A – G 21898 — 13 (2015/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3.1 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයෙකුට 2014.10.31 දිනදී ගෙවනු ලබන මූලික වැටුපෙන් 8% කට සමානවූ මුදලක් එවැනි සේවකයෙකුගේ වැටුපට එකතු කරනු ලැබේ.

3.2 2015.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයෙකුට 2015.10.31 දිනදී ගෙවනු ලබන මූලික වැටුපෙන් 7% කට සමානවූ මුදලක් එවැනි සේවකයෙකුගේ වැටුපට එකතු කරනු ලැබේ.

4. පැමිණීමේ දිරිදීමනා.

සේවකයින්ට මසකට රුපියල් 850/- ක් (අටසිය පනහක්) බැගින්වූ පැමිණීමේ දිරි දීමනාවක් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ගෙවනු ලැබේ.

4.1 සේවකයෙකුට සම්පූර්ණ දිරිදීමනාව ගෙවනු ලබන්නේ ඔහු/ඇය ලිත් මසකදී සෙනසුරාද/ඉරිදා/වෙනත් නිවාඩු දින හා අතිකාල සේවය සඳහන්වූ කාලය අතහැර, වැඩකිරීම නියම කර ඇති සියළුම දිනවල/වැඩමුර වල සේවය සඳහා වාර්තා කළහොත් පමණකි.

4.2 මෙම දිරිදීමනාව සෙනසුරාදා/ඉරිදා/වෙනත් නිවාඩු දිනවල අතිකාල දීමනා මත සේවය සඳහා වාර්තා කිරීම අවශ්‍ය වන සේවකයින්ට ගෙවනු නොලැබේ.

4.3 ඔහුගේ/ඇයගේ අනුමත නිවාඩු (වාර්ෂික/අනියම්/අසනීප/හිළවු නිවාඩු/හදිසි අනතුරු නිවාඩු) මත යම් සේවකයෙකු නොපැමිණි අවස්ථාවකදී එවැනි නොපැමිණි දිනය සඳහා දිරිදීමනාව ලබාගැනීම සඳහා එවැනි සේවකයෙකුට හිමිකම නොලැබෙනු ඇත. එනම් : මෙම දිරිදීමනාවට සුදුසුකම් ලැබීම සඳහා සේවකයෙකු වැඩ කිරීමට කායිකව පැමිණ සිටිය යුතුය. ඉහත නියම කර ඇති පරිදි නොපැමිණෙන එක් දිනයක් සඳහා මාසික දිරිදීමනාවෙන් 1/20 කට සමාන මුදලක් අඩු කරනු ලැබේ. කෙසේවුවද, සේවකයෙකුට මාසික පැමිණීමේ දිරිදීමනාවෙන් අඩුකිරීමක් රහිතව එක් ලිත් මාසයකට වාර්ෂික නිවාඩුවෙන් එක් (01) දිනයක් බැගින් අනුමත නිවාඩු ලබාගත හැකිය.

4.4 අනුමැතියකින් තොරව සේවකයෙකු නොපැමිණ සිටින්නේ නම් (එනම් : අනවසරයෙන් නොපැමිණීම) ඔහුට/ඇයට එම මාසය සඳහාවූ සම්පූර්ණ දිරිදීමනාව අහිමි වනු ඇත.

5. සේවකයින්ට එක් එක් ශ්‍රේණියට අදාලව 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යසාධනය පදනම් කර ගත් වාර්ෂික වැටුප් වැඩිවීම පහත දක්වෙන පරිදි වේ.

5.1 1 ශ්‍රේණිය - රුපි. 75.00
5.2 11 ශ්‍රේණිය - රුපි. 100.00
5.3 111 ශ්‍රේණිය - රුපි. 120.00

6. 6.1 සේවකයින්ට ගෙවිය යුතු වන වැඩ මුර දීමනාව පහත දක්වෙන පරිදිය.

පළමුවන වැඩමුරය රුපි. 137.50
දෙවන වැඩමුරය රුපි. 131.00
තුන්වන වැඩමුරය රුපි. 131.00

6.2 සාමාන්‍ය වැඩමුරයේ නියුතු සේවකයින් සඳහා දිනකට රුපි. 34.50 බැගින් වූ 'දෛනික පැමිණීමේ ප්‍රසාද' මුදලක් ගෙවනු ලැබේ.

6.3 ඉහත දක්වීම අනුව කර්මාන්තශාලාවේ සියළුම සේවකයින් (ක්‍රෙස්ට් අංශය හැර) එක්කෝ 6.1 හි වැඩමුර දීමනාව හෝ 6.2 හි 'දෛනික පැමිණීමේ ප්‍රසාද' මුදලක් සඳහා හිමිකම ලබන ඇත.

6.4 තවද, ශීත කාමර වල සේවයේ යෙදෙන සේවකයින් සඳහා ශීත කාමර දීමනාව දිනකට රුපි. 48.50 ක් වනු ඇත.

7. රියදුරන්ගේ/සහායකයින්ගේ බටා

| | |
|---|---|
| පෙ.ව. 11.00 සහ ප.ව. 12.30 අතරවූ කාලය අතහැර පැය 3 කට වඩා පිටත ගමනෙහි යෙදී ප.ව. 2.00 පසුව ආපසු එන විට | රුපි. 55.00 |
| උදා: පිටත්වීම පෙ.ව. 11.00 ආපසු ඒම ප.ව. 2.00 කොළඹ/මීගමුව පැය 4 කට වැඩි ගමනක් සඳහා | රුපි. 100.00 |
| මහනුවර, බෙන්තොට පැය 8 ට වැඩි | රුපි. 137.50 |
| පැය 8 ට අඩු හිමිකම | රුපි. 89.50 |
| අවිස්සාවේල්ල | රුපි. 89.50 |

| | | |
|---|---|---|
| අනුරාධපුර | 1 වන දින | රුපි. 172.00 |
| | 2 වන දින | රුපි. 172.00 |
| මාතර | එක් දිනක ගමන | රුපි. 247.50 |
| | දෙදිනක ගමන | රුපි. 344.00 |
| | තෙදිනක ගමන | රුපි. 481.50 |
| බණ්ඩාරවෙල දෙදිනක ගමන | | රුපි. 344.00 |

8. ක්‍රෙස්ට් අංශයේ සේවය කරන සේවකයින් සඳහා 2001.11.08 දින 12(1) වගන්තිය යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් ඉදිරිපිටදී අත්සන් කරන ලද සමථයට පත්කිරීමේ සිහිපතෙහි පාර්ශ්වයන් විසින් දැනටමත් එකගවී ඇති නිෂ්පාදන සම්මතයන්ට යටත්ව නිෂ්පාදනයට අදාලවූ පැමිණීමේ බෝනස් මුදල පහත දක්වෙන ආකාරයෙන් ගෙවනු ලැබේ.

ගෙවීම් ප්‍රමාණය එක් දිනකට රුපි. 87.31 බැගිනි නිෂ්පාදන මට්ටම් වලට අදාලව පවත්නා වර්තමාන ගෙවීම් ප්‍රමාණයන් වෙනස් නොවී පවතිනු ඇත.

9. 9.1 මෙම ගිවිසුමෙන් ආවරණවූ සහ බැඳී සිටින වෘත්තීය සංගමය සහ සේවකයින් 2013.10.31 දිනැති ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනාක්‍රමයට අනුගාමීව ප්‍රතිව්‍යුහගත කරන ලද සහ අඩු කරන ලද සේවක සංඛ්‍යාව පිළිබඳව නිසි සැළකිල්ලක් ඇතිව වර්තමාන සේවා තත්ත්වයන්, ස්ථානය, සේවක සංඛ්‍යාව සහ දැනට තිබෙන යන්ත්‍රෝපකරණ යටතේ එක් වැඩ මුරයක් සඳහා සකස් කළ මස් කිලෝ ග්‍රෑම් 2000 ක් සහ අමු මස් කිලෝ ග්‍රෑම් 2000 ක් බැගින් පවත්වාගැනීමට උත්සහ දැරිය යුතුය.

9.2 තවද, 2013.11.01 දින දරන අවබෝධතා ගිවිසුම, මෙම ගිවිසුමේ කොටසක් සහ අංගයක් වශයෙන් සළකනු ලබන බවටද පාර්ශ්වයන් එකග වෙති.

10. 10.1 අනියම් සේවකයින් අවශ්‍යතා පදනම මත සේවයේ යොදවා ගන්නා අතර ඔවුන්ගේ ගෙවීම් අනුපාතයන් වෙළෙඳපොල ගෙවීම් අනුපාතයන් අනුව නිගමනය කරනු ලැබේ.

10.2 මෙහි (1) වන උපලේඛණයේ ලැයිස්තුගත කර ඇති අනියම් සේවකයින් 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කර ගනු ලැබේ. එසේ අන්තර්ග්‍රහණය කරන ලද සේවකයින් විසින් නොපැමිණීම්/පුරප්පාඩු ආවරණය කිරීම සඳහා කර්මාන්තශාලාව ඇතුළත ඕනෑම අංශයක සේවය කිරීම අවශ්‍ය කරනු ලැබේ. 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එවැනි සේවකයින්ගේ මූලික වැටුප මසකට රුපියල් 11,500/- ක් වනු ඇත.

10.3 මෙහි (11) වන උපලේඛණයේ ලැයිස්තුගත කර ඇති සේවකයින්ගේ මූලික වැටුප 2014.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මසකට රුපියල් 12,500/- ක් වශයෙන් ප්‍රතිශෝධනය කරනු ලැබේ. එවැනි සේවකයින් විසින් නොපැමිණීම්/පුරප්පාඩු ආවරණය කිරීම සඳහා කර්මාන්තශාලාව ඇතුළත ඕනෑම අංශයක සේවය කිරීම අවශ්‍ය කරනු ලැබේ.

11. තවද, එකඟවන ලද 2000.11.14 දිනැති ගිවිසුමේ ප්‍රතිපාදන සහ 2001.11.08 දින 12(1) වගන්තිය යටතේ කම්කරු කොමසාරිස් ජනරාල් ඉදිරිපිටදී අත්සන් කරන ලද සමථයට පත්කිරීමේ සිහිපතෙහි පර්ශ්වයන් විසින් දැනටමත් එකඟවී ඇති වැඩ පිළිවෙළ, දීමනා, බටා ප්‍රමාණයන් (අන්‍යෝන්‍යව එකඟවන ලද සංශෝධනයන්ට යටත්ව) සහ ආරාවුල් නිරවුල් කිරීමේ ක්‍රියා පරිපාටිය මෙම ගිවිසුමේ දක්වා ඇති මොනයම් හෝ ප්‍රතිශෝධනයකට යටත්ව මෙම ගිවිසුම බලපවත්වන කාලය ඇතුළත ක්‍රියාත්මකව පවතින බවට පාර්ශවයන් අතර මෙයින් එකඟවනු ලැබේ.

12. සේවක සංඛ්‍යාවට බලපාන කර්මාන්තශාලාවේ වර්තමාන මෙහෙයුම් ආදර්ශයට කැපීපෙනෙන වෙනසක් සිදුවන අවස්ථාවක් ඇති වුවහොත් එම කරුණු පිළිබඳව සංගමය සමග සාකච්ඡා කල හැකිවේ.

13. මෙම ගිවිසුම අඛණ්ඩව පවත්නා කාලය තුළ දෙපාර්ශවයෙන් මොනයම් හෝ පාර්ශවයක් අන්‍යෝන්‍ය එකඟතාවයකින් හැර, අනුදේශ සහ කොන්දේසි හෝ සේවකයින්ට වර්තමානයේ බලපවත්නා ප්‍රතිලාභ මොනයම් හෝ අයුරකින් විචලණය කිරීමට, වෙනස් කිරීමට හෝ එකතු කිරීමට උත්සාහ නොගත යුතු අතර වෘත්තීය සංගමය විසින් එවැනි කරුණු පිළිබඳව මොනයම් හෝ ආකාරයේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග වල නොයෙදිය යුතුය.

මීට සාක්ෂි වශයෙන් වර්ෂ 2014 ක් වූ ඔක්තෝබර් මස දහසය වන දිනදී මෙහි පාර්ශවයන් විසින් අත්සන් තබන ලදී.

අත්සන :- අපැහැදිලිය

කීල්ස් ෆුඩ් ප්‍රෙඩක්ට්ස් පීඑල්සී
සඳහා සහ ඒ වෙනුවෙනි
නම : ජී. ටී. ගුණරත්න
තනතුර : සමූහාධිපති

අත්සන :- අපහැදිලිය

ලංකා වෙළෙඳ, කාර්මික සහ
පොදු කම්කරු සංගමය
සඳහා සහ ඒ වෙනුවෙනි.
නම : එස්. ජයකොඩි

පාරිභෝගික ආහාර සමුහය,
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස්
පීඑල්සී

තනතුර : ප්‍රධාන ලේකම්

අත්සන :- අපැහැදිලිය
නම : ඒ.ඒ.ඩී.එච්.සී. අබේපිටිය
තනතුර : මෙහෙයුම් ප්‍රධානී

අත්සන :- අපැහැදිලිය
නම : යූ. ජී. මහින්ද
තනතුර : ශාඛා සභාපති

සාක්ෂිකරුවන් :

1. අත්සන:- අපැහැදිලිය
නම : නිලන්ත ජයසිංහ
තනතුර : කාර්මික සබඳතා ප්‍රධානී

1. අත්සන :- අපැහැදිලිය
නම : ලෝරන්ස් පෙරේරා
තනතුර : ශාඛා ලේකම්

2. අත්සන :- අපැහැදිලිය
නමඃ තරංග දිල්හාන්
තනතුර : මානව සම්පත් ප්‍රධානී

2. අත්සන :- අපැහැදිලිය
නම : බී. එස්. පී. කුමාර
තනතුර : ශාඛා උප සභාපති

I වන උපලේඛණය

| අංකය | අනියම් සේවකයාගේ නම | සේවයේ යෙදවූ දිනය | අනියම් සේවක අංකය |
|---|---|---|---|
| 1 | ඩබ්.පී.එස්.එච්. ප්‍රනාන්දු | 12.07.2012 | ටී 1452 |

II වන උපලේඛණය

| අංකය | සේවක අංකය | මුලකුරු | නාමය |
|---|---|---|---|
| 1. | 1441 | ඒ.කේ.එස්. | ප්‍රියමාල් |
| 2. | 1442 | ජේ.එම්.යූ.ජී.එස්. | කුමාර |
| 3. | 1443 | එම්.ජී.එස්.එස්. | පුෂ්පකුමාර |
| 4. | 1444 | යූ. | පියරත්න |
| 5. | 1445 | එල්.යූ.ජී.එන්. | ජයරත්න |
| 6. | 1446 | එම්.එල්.එස්. | රණසිංහ |
| 7. | 1448 | ආර්.ඒ.පී. | මංජුල |

මවිසින් පරිවර්තනය කරන ලදී.

බී. තිස්ස ප්‍රනාන්දු,
කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ,
දිවුරුම්දුන් භාෂා පරිවර්තක,
169/4, ගාලු පාර,
කොල්ලුපිටිය, කොළඹ 03.
දු.කඃ 2454929
ඊමේල් : tissapasan@hotmail.com

07 - 1350